# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 1567/6 - 2008 සැප්තැම්බර් 15 වැනි සඳුදා - 2008.09.15

(ආණ්ඩුවේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

### ආණ්ඩුවේ නිවේදන

එල්.ඩී.බී. 21/78 (v).

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 18 වන වගන්තිය සමග කියවිය යුතු, එහි 24අ වන වගන්තිය යටතේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් සාදන ලද නියමාවලිය.

ලේකම්,
විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව.

2008 අගෝස්තු මස 25 වැනි දින,
කොළඹ දී ය.

නියමාවලිය

1. මෙම නියමාවලිය 2008 අංක 3 දරන මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා උසස් අධ්‍යයනය සඳහා වූ ජාතික මධ්‍යස්ථානය (සංශෝධන) නියමාවලිය ලෙස හඳුන්වනු ලැබේ.

2. 2005 ඔක්තෝබර් මස 19 වන දින අංක 1415/17 දරන අති විශෙෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද 2005 මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා උසස් අධ්‍යයනය සඳහා වූ ජාතික මධ්‍යස්ථානය නියමාවලිය පහත සඳහන් පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

(1) එම නියමාවලියේ 6 වන ඡේදයේ (ඇ) අයිතමය ඉවත් කොට ඒ වෙනුවට පහත සඳහන් අයිතමය ආදේශ කිරීමෙන් :—

"(ඇ) අධ්‍යයන මණ්ඩල.";

(2) එම නියමාවලියේ 7 වන ඡේදයේ (2) වන සහ (3) වන අනුඡේද ඉවත් කොට ඒ වෙනුවට පහත සඳහන් කොටස ආදේශ කිරීමෙන් :—

" (2) (අ) රීජන්ට්ස් කවුන්සිලය -

(i) සභාපතිවරයා විය යුතු, උසස් අධ්‍යාපන විෂයය භාර අමාත්‍යවරයාගෙන් ;

(ii) කොමිෂන් සභාවේ සභාපතිවරයාගෙන් ;

(iii) කළමනාකරණ සභාවේ සභාපතිවරයාගෙන් ;

(iv) අදාළ ස්ථාවර කාරක සභා මගින් නම් කරනු ලබන මානව ශාස්ත්‍ර සහ සමාජ විද්‍යා අධ්‍යයන අංශවලට අදාළ පීඨවල පීඨාධිපතිවරු හය (06) දෙනෙකුගෙන් ; සහ

(v) කොමිෂන් සභාව විසින් කොමිෂන් සභාවේ අදහස අනුව, සම්බන්ධිත හෝ අදාළ ක්ෂේත්‍රවල විශිෂ්ඨතාවයක් ලබා ඇති තැනැත්තන් අතුරින් පත් කරනු ලබන හතර (04) දෙනෙකුගෙන්

සමන්විත විය යුතු ය.

(ආ) සභාපතිවරයා රීජන්ට්ස් කවුන්සිලයේ සෑම රැස්වීමකම මුලසුන දැරිය යුතු ය. එසේ වුව ද, සභාපතිවරයා නොපැමිණ ඇති අවස්ථාවක, කොමිෂන් සභාවේ සභාපතිවරයා කවුන්සිලයේ සෑම රැස්වීමකම මුලසුන දැරිය යුතු ය. සභාපතිවරයා සහ කොමිෂන් සභාවේ සභාපතිවරයා යන දෙදෙනාම රීජන්ට්ස් කවුන්සිලයේ යම් රැස්වීමකට නොපැමිණ ඇති අවස්ථාවක දී, පැමිණ සිටින සාමාජිකයන් විසින් ඔවුන් අතුරින් යම් තැනැත්තකු රැස්වීමේ සභාපතිවරයා ලෙස කටයුතු කිරීමට තෝරාපත් කර ගත යුතු ය.

(3) ජනාධිපතිවරයා මධ්‍යස්ථානයේ සහ රීජන්ට්ස් කවුන්සිලයේ අනුශාසකවරයා විය යුතු අතර, කවුන්සිලය, ජනාධිපතිවරයා හමුවීම අවශ්‍ය වන අවස්ථාවල දී එසේ කළ යුතුය. ";

(3) එම නියමාවලියේ 11 වන ඡේදයේ :-

(1) (3) වන සහ (4) වන අනුඡේද ඉවත්කොට ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න :—

"(3) කළමනාකරණ සභාව -

(i) සභාපතිවරයා විය යුතු අධ්‍යක්ෂවරයා ;

(ii) අදාළ ස්ථාවර කාරක සභා මගින් නම් කරනු ලබන මානව ශාස්ත්‍ර සහ සමාජ විද්‍යා අධ්‍යයන අංශවලට අදාළ පීඨවල පීඨාධිපතිවරු හය (06) දෙදෙනකුගෙන් ; සහ

(iii) කොමිෂන් සභාව විසින් කොමිෂන් සභාවේ අදහස අනුව, සම්බන්ධිත හෝ අදාළ ක්ෂේත්‍රවල විශිෂ්ඨතාවයක් ලබා ඇති තැනැත්තන් අතුරින් පත් කරනු ලබන හතර (04) දෙදෙකුගෙන්

සමන්විත විය යුතු ය.

(2) එහි (6) වන අනුඡේදයේ "හතරෙන් එකක් විය යුතු ය." යන වචන වෙනුවට "තුනෙන් එකක් විය යුතු ය. " යන වචන ආදේශ කිරීමෙන් ;

(4) 13 වන ඡේදය ඉවත්කොට ඒ වෙනුවට පහත සඳහන් කොටස ආදේශ කරන්න :—

"(3) රීජන්ට්ස් කවුන්සිලයට අධ්‍යයන සහ අනෙකුත් සම්බන්ධිත කාරණා සම්බන්ධයෙන් උපදෙස් දීම සඳහා අවශ්‍ය විය හැකි යැයි සලකනු ලබන අධ්‍යයන මණ්ඩල සහ වෙනත් මණ්ඩල රීජන්ට්ස් කවුන්සිලය විසින් කළමනාකරණ සභාවේ උපදෙස් මත, කලින් කල, පත් කරනු ලැබිය හැකි ය. "

10-21

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.